චක්‍රලේඛ අංක 26/2010

මගේ අංකය:- ඩබ්/සි.සු.දි/2010
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2010.08.18

සියළුම බන්ධනාගාර අධිකාරීන් / සහකාර අධිකාරීන් වෙත,

## සිරකරු දිනය සැමරීම - 2010.09.12

සිරකරු දිනය නිමිත්තෙන් මගේ අංක ඩබ්/05/08/10 හා 2010.07.07 දිනැති ලිපියෙන් ඔබවෙත දන්වා ඇති වැඩ පිළිවලට අමතර වශයෙන් පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා මෙන් දන්වා සිටිමි.

02. සියළුම බන්ධනාගාර ආයතනවල ''සිරකරු දිනය සැමරීම'' යථෝක්ත දිනට සතියකට පෙර ක්‍රමානුකූලව ආරම්භ කිරීමට පියවර ගතයුතුව ඇත. එම සතිය 2010.09.05 දින සිට පිළිවෙලින් කොඩි දිනය, සෞඛ්‍ය දිනය, නීති ආධාර දිනය, අධ්‍යාපන දිනය, වෘත්තිය පුහුණු වැඩසටහන් දිනය, ක්‍රීඩා දිනය, ශ්‍රමදාන දිනය, ආගමික හා පවුල් හමු දිනය වශයෙන් නම් කිරීමටත් සැප්තැම්බර් 12 වන දින පස්වරුවේ ඔබගේ ප්‍රධානත්වයෙන් සිරකරු දිනය සැමරීමේඋත්සවයක් පැවැත් වීමටත්,කටයුතු කලයුතු බව දන්වමි. තවද මෙම කාර්යය සඳහා ඔබ ආයතනයට සම්බන්ධ සිරකරු සුභසාධක සංගමයේ ප්‍රාදේශීය කමිටුවද, අවශ්‍ය සම්පත් දායකයින් ලෙස රාජ්‍ය ආයතන, සංස්ථා, මණ්ඩල, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රදේශයේ ප්‍රභූන් සම්බන්ධ කරගනිමින් යතෝක්ත වැඩපිළිවෙල වඩාත් සාර්ථක කරගැනීමට ඔබගේ පූර්ණ දායකත්වය ලබා දිය යුතුව ඇත.

03.ශ්‍රී ලංකා සිරකරු සුභසාධක සංගමය සමඟ එක්ව මෙම වැඩසටහන පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කෙරෙන අතර ප්‍රධාන උත්සවය 2010.09.12 වන දින පස්වරු 2.00 ට ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

04. මෙවර පැවැත්වෙන සිරකරු දිනය සැමරීමේ වැඩසටහන පදනම් කරගෙන ඉදිරි වර්ෂය සඳහා සිරකරු සුභසාධක වැඩසටහන් සකස් කරගන්නා ලෙසට උපදෙස් දෙන අතර සිරකරු දින වැඩසටහන වඩාත් සාර්ථක කරගැනීම පිණිස ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන මෙන්ද වැඩිදුරටත් දන්වමි.

වී.ආර්.සිල්වා ආර්එස්පී, යූඑස්පී, එන්ඩියූ, අයිපී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත :- ලේකම්
පුනරුත්ථාපන හා බන්ධනාගර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය. - දැ.ගැ.පි.
(වැඩසටහනේ පිටපතක්ද මෙයට අමුණා ඇත.)